ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	33	S	I	ගිණුම්කරණය I Accounting I	කාලය : පැය දෙකයි Time : Two hours

උපදෙස් :

1) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
2) අංක **01** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
3) සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු හිමි වේ.

1. ගිණුම්කරණයේ අරමුණ වඩාත් හොඳින් විස්තර කර දැක්වෙන්නේ පහත කුමන ප්‍රකාශය මගින් ද?
   1) ගිණුම්කරණ ක්‍රියාවලිය නිසි පරිදි පවත්වා ගනිමින් ආයතනයේ ගිණුම් කටයුතුභාවය ආරක්ෂා කර ගැනීම යි.
   2) වාර්තාකරණ ඒකකයක සියලුම ගනුදෙනු නිවැරදිව සටහන් කර ලාභ/අලාභ ගණනය කිරීම සහ එය සන්නිවේදනය කිරීම යි.
   3) අයිතිකරුවන්ට සහ කළමනාකරුවන්ට ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ව තොරතුරු සන්නිවේදනය කිරීම යි.
   4) වාර්තාකරණ ඒකකය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික තොරතුරු සන්නිවේදනය කිරීම යි.
   5) ප්‍රමිත සහ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ කටයුතු පවත්වාගෙන යාම යි. (.....)

2. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන මූලිකාංග මැනීමේ දී යොදාගත හැකි මිනුම්කරණ පදනමක් **නොවන්නේ** මින් කවරක් ද?
   1) සාධාරණ අගය
   2) ප්‍රවර්ථන පිරිවැය
   3) ප්‍රයෝජ්‍ය අගය
   4) පුරෝකථන අගය
   5) ඓතිහාසික පිරිවැය

   (.....)

3. පහත සඳහන් එක් එක් ප්‍රකාශනයට වඩාත් අදාළ වන ගිණුම්කරණ සංකල්පය අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   A. දේපළ පිරියත හා උපකරණ එහි ඵලදායී ජීවකාලය පුරා ක්‍රමානුකූලව ලියා හැරීම.
   B. තොග තක්සේරුව සඳහා භාවිත කරන ලද පිරිවැය සූත්‍රය ගිණුම්කරණ සටහන් තුළ නිරූපණය කිරීම.
   C. වගකීම් සහතික සඳහා වාර්ෂික වියදම ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගැනීම.

   1) ගැලපුම් සංකල්පය, අනාවරණ සංකල්පය, ආරක්ෂණ සංකල්පය.
   2) අඛණ්ඩ පැවැත්ම සංකල්පය, අනාවරණ සංකල්පය, ගැලපුම් සංකල්පය.
   3) ගැලපුම් සංකල්පය, සංගතතා සංකල්පය, ආරක්ෂණ සංකල්පය.
   4) අඛණ්ඩ පැවැත්ම සංකල්පය, සංගතතා සංකල්පය, ආරක්ෂණ සංකල්පය.
   5) ගැලපුම් සංකල්පය, අනාවරණ සංකල්පය, ගැලපුම් සංකල්පය. (.....)

4. සඳලිගේ ව්‍යාපාරයේ 2025.04.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වටිනාකම් පහත දැක්වේ (ආයතනය VAT සඳහා ලියාපදිංචි වී ඇත.) (රු.)

   ජංගම නොවන වත්කම් + ජංගම වත්කම් = ජංගම නොවන වගකීම් + ජංගම වගකීම් + හිමිකම
   500 000 + 80 000 = 100 000 + 30 000 + 450 000

   අප්‍රේල් මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.
   - 10% ක VAT සහිතව රු.52 800 ක භාණ්ඩ ණයට විකිණීම.(පිරිවැය මත දළ ලාභ අනුපාතය 20% කි.)
   - 2025.04.01 දිනට උපචිත විදුලි වියදම, අප්‍රේල් මාසයේ දී ගෙවීම රු. 6 000
   - 10% සහිතව රු. 27 500 ක භාණ්ඩ ණයට ගැනීම.

   ගනුදෙනුවල ශුද්ධ බලපෑම ගිණුම්කරණ සමීකරණයට නිවැරදිව ගැලපූ විට දැක්වෙන පිළිතුර වන්නේ, (රු.)

	ජංගම නොවන වත්කම්	ජංගම වත්කම්	ජංගම නොවන වගකීම්	ජංගම වගකීම්	හිමිකම
1)	500 000	80 000	100 000	30 000	450 000
2)	500 000	114 300	100 000	56 300	458 000
3)	500 000	111 800	100 000	53 800	458 000
4)	500 000	105 800	100 000	53 800	452 000
5)	500 000	114 300	100 000	30 000	452 800

(.....)

5. මූලාශ්‍ර ලේඛණ වල ප්‍රයේජන ලෙස පහත ඒවා දී ඇත.
   A. ගනුදෙනුවේ සම්පූර්ණ විස්තර ලබාගත හැකිවීම.
   B. ගනුදෙනුවේ විස්තර බාහිර පාර්ශවයන්ට ලබාදීමට යොදාගත හැකි වීම.
   C. ගනුදෙනුව ගිණුම් පොත්වල ලිවීම සඳහා පදනම් කරගන්නා ලියවිල්ලක් ලෙස භාවිතා කළ හැකිවීම.
   D. ගනුදෙනුව සාධාරණව සිදු වූ බව සනාථ කළ හැකිවීම.

   ඉහත සඳහන් ඒවා අතරින් නිවැරදි වන්නේ

   1) B හා C
   2) A හා C
   3) B හා D
   4) A, C හා D
   5) C පමණි.

(.....)

6. පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ පොදු ලෙජරය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ ද?
   A. ආයතනයක ගනුදෙනු ප්‍රථමයෙන් පොදු ලෙරජයෙහි සටහන් කරනු ලබයි.
   B. ආයතනයක් විසින් ද්විත්ව සටහන් ක්‍රමය මත පදනම්ව පවත්වාගෙන යනු ලබන ගිණුම් සමූහය පොදු ලෙජරය වේ.
   C. ආයතනයක ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කළ පසුව පොදු ලෙජරයට පිටපත් කරනු ලබයි.
   D. ගිණුම් කාලච්ඡේදය අවසානයේදී ආයතනයක පොදු ලෙජරයෙහි සියලු ගිණුම් සඳහා පියවීමේ සටහන් තබනු ලැබේ.

   1) A පමණි
   2) B හා C පමණි
   3) A , B හා C පමණි
   4) B, C හා D පමණි
   5) A B, C හා D යන සියල්ලම

(.....)

7. පහත තොරතුරු 2025 මාර්තු මාසය සඳහා සමාධි ව්‍යාපාරයට අදාළ වේ.

විකුණුම්	ලකුණු කළ මිල (රු'000)	වෙළෙඳ වට්ටම්
මුදලට	5 000	10%
ණයට	4 000	5%

විකුණුම් දින සිට දින 15 ක් ගෙවිය යුතු මුදල පියවූ විට ණයගැතියන්ට 5% ක මුදල් වට්ටමක් දෙනු ලැබේ. ව්‍යාපාරයේ වාර්තාවලට අනුව ණයගැති ශේෂවලින් 50% ක් මෙම වට්ටම භාවිත කරමින් පියවා ඇත. ණයගැතියන්ට දුන් වට්ටම් සටහන් කිරීම සඳහා නිවැරදි ජර්නල් සටහන වනුයේ :

	හර (රු)		බැර (රු)
1)	දුන් වට්ටම් ගිණුම	95 000	මුදල් ගිණුම 95 000
2)	දුන් වට්ටම් ගිණුම	95 000	ණයගැති පාලන ගිණුම 95 000
3)	දුන් වට්ටම් ගිණුම	195 000	මුදල් ගිණුම 195 000
4)	දුන් වට්ටම් ගිණුම	295 000	ණයගැති පාලන ගිණුම 295 000
5)	දුන් වට්ටම් ගිණුම	395 000	මුදල් ගිණුම 395 000

(.....)

ප්‍රශ්න අංක 8 සහ 9 සඳහා අදාල වන තොරතුරු

පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගිණුම්කරණ වැරදි කීපයකි

A. ආපසු එවුම් ජ'නලයේ එකතුව රු. 1 000 ක් වැඩිය.
B. ගෙවූ රක්ෂණ ගාස්තු 3 200 ක් මුදල් ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 2 300 ක් ලෙසය.
C. රු. 5 000 ක කාර්යාල උපකරණ වර්ෂයේ මාස 6 ක් ගතවීමෙන් පසු මිලදී ගෙන ඇත. එහෙත් මෙම පිරිවැය කාර්යාල උපකරණ අලුත්වැඩියාව වියදම් ගිණුමට හරකර ඇත. කාර්යාල උපකරණ පිරිවැයෙන් 10% ක් ක්ෂය කරයි.
D. වර්ෂය ආරම්භයේ පැවති උපචිත විදුලි වියදම් රු. 2 400 ක් විදුලි වියදම් ගිණුමේ හර ශේෂයක් ලෙස ඇතුලත් කර ඇත.

අවිනිශ්චිත ගිණුමේ ශේෂය මූල්‍යතත්ව ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

8. අවිනිශ්චිත ගිණුමේ ශේෂය වන්නේ

1) රු. 5 700 හර
2) රු. 5 700 බැර
3) රු. 3 800 හර
4) රු. 3 800 බැර
5) රු. 6 700 හර

(.....)

9. වැරදි සිදු වී තිබියදී ගණනය කර ඇති ලාභය රු. 120 000 කි. වැරදි නිවැරදි කලපසු නිවැරදි ලාභය වන්නේ

1) රු. 129 900
2) රු. 130 800
3) රු. 126 650
4) රු. 127 250
5) රු. 130 550

(.....)

10. 2025 ජූලි 31 දිනට බැර නොවූ තැන්පතු රු. 30 000 කි. මේ සියල්ල අගෝස්තු මාසයේදී බැරවිය. එදිනට බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 42 000 කි. මෙයින් රු. 28 000 ක් අගෝස්තු මාසයේදී ගෙවා ඇත. 2025 අගෝස්තු 31 දිනට බැංකු විස්තරයේ ශේෂය රු. 80 000 කි. අගෝස්තු මාසයේ තැන්පත් කල චෙක්පත්වලින් රු. 16 000 ක චෙක්පත් නිශ්කාශනය වී නොමැති අතර අගෝස්තු මාසයේ නිකුත් කල චෙක්පත්වලින් රු. 20 000 ක චෙක්පත් බැංකුවට ඉදිරිපත් වී නැත. අගෝස්තු 31 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය කුමක්ද?

1) රු. 86 000
2) රු. 94 000
3) රු. 72 000
4) රු. 62 000
5) රු. 112 000

(.....)

11 සහ 12 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

2024/2025 වර්ෂය තුල අමුද්‍රව්‍ය ගැණුම් රු. 220 000 එම වර්ෂය තුල දැරූ සෘජු ශ්‍රම පිරිවැය රු. 180 000 ක් වන අතර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 90 000 කි. වර්ෂය තුල තොගයෙහි වෙනස්වීම් පහත දැක්වේ.

අමුද්‍රව්‍ය තොගයෙහි වැඩිවීම	රු. 20 000
නොනිමි භාණ්ඩ තොගයෙහි අඩුවීම	රු. 8 000
නිමි භාණ්ඩ තොගයෙහි වැඩිවීම	රු. 40 000

11. නිමි භාණ්ඩවල ප්‍රාථමික පිරිවැය කොපමණද?

1) රු. 380 000
2) රු. 400 000
3) රු. 412 000
4) රු. 420 000
5) රු. 478 000

(.....)

12. නිමි භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය කොපමණද?

1) රු. 502 000
2) රු. 438 000
3) රු. 478 000
4) රු. 518 000
5) රු. 388 000

(.....)

13. 2024/04/01 දින පිහිටුවන ලද සුභසාධක සමිතියට වර්ෂය ආරම්භයේ බැඳුණු සාමාජිකයින් ගණන 240 කි. ඔවුන්ගෙන් 20 දෙනෙකු යාවජීව සාමාජිකයින් වන අතර ඔවුන් වසර 10ක සාමාජික මුදල් යාවජීව සාමාජික මුදල් ලෙස එකවර ගෙවා ඇත. සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 1 500 කි. සාමාජිකයින් 25 දෙනෙකු ප්‍රවර්තන වර්ෂයට අදාළ සාමාජික ගාස්තුව ගෙවා නොමැති අතර 40 දෙනෙකු 2025/04/01 දිනෙන් ආරම්භ වන වර්ෂය සඳහා ප්‍රවර්තන වර්ෂය තුළ සාමාජික ගාස්තු ගෙවා ඇත. යාවජීව සාමාජික මුදල් වසර 10ක කාලසීමාවක් තුළ සමාන ව ආදායමක් ලෙස හඳුනා ගනී. 2025/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු සාමාජික මුදල් ආදායම සහ ලද මුළු සාමාජික මුදල පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

	මුළු සාමාජික මුදල් ආදායම (රු.'000)	ලද මුළු සාමාජික මුදල (රු.'000)
1)	360	352.5
2)	345	607.5
3)	360	652.5
4)	330	352.5
5)	345	652.5

(.....)

14 සිට 15 දක්වා පිළිතුරු සැපයීමට

හවුල්කරුගේ ජංගම ගිණුම 000

	චාමර	සාගර		චාමර	සාගර
ගැණිලි	50	60	ඉ/ගෙ/ ශේෂය	300	200
ප/ගෙ/ශේෂය	464	356	ප්‍රාග්ධන පොලී	40	30
			ණයපොලී	30	-
			ගොඩනැගිලි කුලි	-	48
			හවුල් වේතන	24	48
			ලාභ	120	90
	514	416		514	416

14. මෙම ව්‍යාපාරයේ චාමර ගේ ප්‍රාග්ධනය 600 000 කි. සාගර ගේ ප්‍රාග්ධනය හා හවුල් ව්‍යාපාරයේ ලාභයෙන් සාගර ව්‍යාපාරයේම රඳවා ඇති ප්‍රමාණය කොපමණද?

සාගර ගේ ප්‍රාග්ධනය	රඳවා ඇති ප්‍රමාණය
1) රු. 450 000	356 000
2) රු. 600 000	156 000
3) රු. 600 000	356 000
4) රු. 450 000	108 000
5) රු. 450 000	156 000

(.....)

15. මෙම ව්‍යාපාරයේ ලාභාලාභ අනුපාතය ව්‍යාපාරය උපයා ඇති ශුද්ධ ලාභය කොපමණද?

ලාභාලාභ අනුපාතය	ශුද්ධ ලාභය
1) 3 : 4	352000
2) 2 : 1	430000
3) 4 : 3	352000
4) 3 : 2	320000
5) 4 : 3	430000

(.....)

16. මූල්‍ය ප්‍රකාශ පිලියෙළ කිරීමේදී ඒවා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග කීපයක් පහත දැක්වේ.

A. මූල්‍ය ප්‍රකාශන එම ව්‍යාපාරයට අදාල ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිලියෙළ කිරීම

B. ගිණුම්කරණ ප්‍රමිතීන්ට ඇති අනුකූලතාවය පිළිබඳව ප්‍රකාශයක් කිරීම

C. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS - 8) අනුව ගිණුම් ප්‍රතිපත්ති තෝරාගැනීම

D. සියලුම ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිලියෙළ කිරීම හා එසේ නොකලේ නම් ඒ බව හෙලිදරව් කිරීම

E. අදාලත්වයල විශ්වාසවන්නීය නියෝජනයල යන ගුණාංගයන්ගෙන් යුතුව තොරතුරු ඉදිරිපත් කිරීම

ඉහත ඒවා අතුරින් සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා පිළිපැදිය යුත්තේ

1) A, B හා C පමණි..
2) A, B හා E පමණි.
3) A, C හා E පමණි..
4) A, B, ක හා E පමණි..
5) A,B, C, D, E යන සියල්ලම

(.....)

17. චතුරසමාගම විසින් 2020/04/01 දින රු. 4 500 000 ක් වටිනා යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. එදින මෙහි ඵලදායී ජීව කාලය වසර 8 ක් සහ සුන්බුන් අගය රු. 500 000 ක් ලෙස ඇස්තමේන්තු කෙරිණි. 2024/04/01 දින මෙම යන්ත්‍රය රු. 1 000 000 ක පිරිවැයක් දරා අලුත්වැඩියා කරන ලදී. ඒ හේතුවෙන් ඵලදායී ජීව කාලය වසර 4 කින් වර්ධනය වූ අතර සුන්බුන් අගය වෙනස් වී නොමැත. 2024/04/01 දිනට යන්ත්‍රයේ ධාරණ අගය සහ අලුත්වැඩියාව හේතුවෙන් 2025/03/31 න් අවසන් වර්ෂයේ ලාභයට වන බලපෑම ගණනය කරන්න.

2024/04/01 දිනට ධාරණ අගය	2025/03/31 න් අවසන් වර්ෂයේ ලාභයට වන බලපෑම
1) රු. 3 500 000	රු. 375 000 කින් අඩු වේ.
2) රු. 2 500 000	රු. 250 000 කින් වැඩි වේ.
3) රු. 2 500 000	රු. 250 000 කින් අඩු වේ.
4) රු. 3 000 000	රු. 375 000 කින් වැඩි වේ.
5) රු. 3 500 000	රු. 500 000 කින් අඩු වේ.

(.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

18. LKAS 2 අනුව තොග සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කළ යුතු කරුණක් නොවන්නේ කුමක් ද?
1) තොගයේ ධාරණ අගය.
2) තොගය ශුද්ධ උපලබ්ධි අගය දක්වා කපා හැරීම.
3) තොගයේ වර්ගීකරණය.
4) තොග ආශ්‍රිතව යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.
5) තොග පිරිවැය ගණනය කල ආකාර

(.....)

19. 2024.04.01 දිනට සීමිත අශානි පොදු සමාගමේ නිකුත් කළ සාමාන්‍ය කොටස් 500 000 ක්ද ප්‍රකාශිත සමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 10 000 000 ක් ද විය. 2024.07.01 දින තිබූ සෑම කොටස් 5 කට 1 බැගින් එක් කොටසක් රු. 20 ක මිලකට කොටස් නිකුත් කරමින් සමාගම රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. තවද 2025.01.01 දින ඒදිනට පවති සෑම කොටස් 6 කට 1 බැගින් කොටසක මිල රු. 15 ක් වූ හිමිකම් නිකුතුවක් සිදු කරන ලදී. කොටස්කරුවන් විසින් සියලු ම හිමිකම් ලබාගන්නා ලදී. මෙම ගනුදෙනු නිසා 2025.03.31 දිනට සමාගමේ හිමිකමේ වැඩිවීම හෝ අඩුවීම කොපමණද?
1) රු. 2 000 000 කින් අඩු වේ.
2) රු. 500 000 කින් අඩු වේ.
3) රු. 1 500 000 කින් වැඩි වේ.
4) රු. 2 000 000 කින් වැඩි වේ.
5) රු. 3 500000 කින් වැඩි වේ

(.....)

20. පහත සඳහන් කුමන දෑ ආයතනයක අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කෙරේ ද?
A. මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලක්
B. ආයතනයට එරෙහි නොවිසඳුනු නඩුවක්
C. වෙනත් ආයතනයක් ලබාගත් ණයක් සඳහා ඇපකරුවකු වීමට ඇතිකරගත් එකඟතාවක්
D. බැංකු ගණුමෙහි දැක්වෙන අයිරා ශේෂයක්
1) A සහ B පමණි
2) A සහ C පමණි
3) B සහ C පමණි
4) A, B සහ D පමණි
5) A, B සහ C පමණි

(.....)

21. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සදරුස් සමාගමේ මූල්‍ය ප්‍රකාශන එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.06.30 දින අනුමත කරන ලදී. 2025.04.01 සහ 2025.06.30 අතර කාලය තුළ දී මෙම සමාගමේ පහත සිද්ධීන් සිදුවිය.
A. අබණ්ඩව අලාභ ලබන ව්‍යාපාර අංශයක මෙහෙයුම් කටයුතු නතර කිරීමට සැලැස්මක් නිවේදනය කිරීම
B. වාර්තාකරන දිනට සැලකිය යුතු මුදලක් ගෙවිය යුතු ණයගැතියකු බුන්වත් වීම
C. වෙළෙඳපොළ අගයන් පහත වැටීම නිසා කෙටි කාලීන ආයෝජනවල අගය අඩුවීම
D. උසාවි තීන්දුවකට අනුව වාර්තාකරන දිනට හඳුනාගත යුතු වගකීමක් තිබූ බව තහවුරු වීම

ඉහත සඳහන් කුමන සිදුවීම් මූල්‍යතත්ව දිනට ගැළපිය යුතු වේ ද?
1) A සහ C පමණි
2) B සහ D පමණි
3) A, B සහ D පමණි
4) B, C සහ D පමණි
5) A, B,C යන සියල්ලමය

(.....)

22. සීමිත සුමුදු පොදු සමාගම යන්ත්‍රයක් කල්බදු ක්‍රමය යටතේ 2024/04/01 දින මිලට ගන්නා ලදී. 2025/03/31 සිට සෑම වසරක ම මාර්තු 31 දින රු. 50 000 බැගින් වාර්ෂික වාරිකය ගෙවිය යුතු ය. මූලික ගෙවීම රු. 50 000 කි. සමාගම රු22 000ක වියදමක් දරා යන්ත්‍රය සවිකරන ලදි කල්බදු කාලසීමාව වර්ෂ 4ක් වන අතර කල්බදු කාලසීමාව අවසානයේ දී වත්කම ගැනුම්කරුට හිමි නොවේ.

වර්ෂය	1	2	3	4
වට්ටම් සාධකය	0.89	0.80	0.71	0.64

2025/03/31 දිනට SLFRS 16 (කල්බදු) ප්‍රමිතයට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු භාවිත අයිතිය සහිත වත්කමේ වටිනාකම වනුයේ,

1) රු. 224 000
2) රු. 168 000
3) රු. 152 000
4) රු. 114 000
5) රු. 126 000

(.....)

23. 2025/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සුමුදු පොදු සමාගමට අදාලව පහත තොරතුරු දී ඇත.

	රු.'000
වර්ෂය සඳහා ලාභය	1 000
වෙළඳ ගෙවිය යුතු දෑ වල අඩු වීම	160
තොගයේ වැඩි වීම	200
වර්ෂයේ අවසාන ආදායම් බදු වගකීම	100
වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු	70
ගොඩනැගිලි ක්ෂය	170
මෝටර් රථ ක්ෂය	100
මෝටර් රථ විකිණීමේ අලාභය	40

LKAS 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) ප්‍රමිතියට අනුව 2025/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහ සීමිත සුමුදු පොදු සමාගමේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

1) රු. 1 120 000
2) රු. 1 480 000
3) රු. 1 050 000
4) රු. 1 170 000
5) රු. 1 000 000

(.....)

24. සමාගමක් තම සංචිත ප්‍රයෝජනයට ගෙන සංචිත ප්‍රාග්ධනිත කිරීමක් කල විට කොටස් හිමියන්ගේ හිමිකමට හා සමාගමේ මුදල් ශේෂයට වන බලපෑම වනුයේ,

	හිමිකම	මුදල් ශේෂය
1)	වැඩි වේ.	වැඩි වේ.
2)	අඩු වේ.	අඩු වේ.
3)	වෙනස් නොවේ.	වැඩි වේ.
4)	වෙනස් නොවේ.	වෙනස් නොවේ.
5)	වැඩි වේ.	වෙනස් නෙවේ.

(.....)

25. නිෂ්පාදන ආයතනයක් භාවිත කරන අමුද්‍රව්‍ය පිළිබඳ දත්ත කිහිපයක් පහත දැක්වේ.

- අවම ඇණවුම් කාලය - දින 2යි.
- සාමාන්‍ය ඇණවුම් කාලය - දින 4යි.
- අවම පරිභෝජනය දිනකට ඒකක 400
- සාමාන්‍ය පරිභෝජනය දිනකට ඒකක 600
- උපරිම තොග මට්ටම ඒකක 5000

ඉහත දත්තවලට අදාළ

	යළි ඇණවුම් මට්ටම	යළි ඇණවුම් ප්‍රමාණය (EOQ)
1)	2,400	1,000
2)	2,400	800
3)	4,600	600
4)	4,800	1,000
5)	4,800	800

(.....)

ප්‍රශ්න අංක 26 හා 27 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

සීමිත සමාගමක 2025 මාර්තු මාසයට පිළියෙල කරන ලද වැටුප් ලේඛනයේ එකතු තීරුවලින් ලබාගත් තොරතුරු

භාවිත කරන්න	(රු.000)
මූලික වැටුප	1200
දීමනා	300
දළ වැටුප	1500
අඩු කිරීම්	
වැටුප් අත්තිකාරම්	(100)
සේ.අ.අරමුදල් 10%	(150)
ශුද්ධ වැටුප	1250
සේවයායාගේ දායකයන්	
සේ.අ.අරමුදල් 15%	225
සේවක භාර අරමුදල්	45

වැටුප් හා සම්බන්ධ සියළුම ගෙවීම් අදාල මාසයෙන් පසු මාසයේදි 10 වන දින ගෙවනු ලැබේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

26. සමාගමේ 2025 මාර්තු මාසයේ ආදායම් ප්‍රකාශනයට හඳුනාගත යුතු වැටුප් හා සම්බන්ද මුළු වියදම කොපමණද?

1) රු. 1920000 3) රු. 1520000 5) රු.1250000
2) රු. 1770000 4) රු. 1500000

(.....)

27. 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වැටුප් හා සම්බන්ධව වගකීම් ලෙස හඳුනාගත යුතු මුළු වටිනාකම කොපමණද?

1) රු. 1735000 3) රු. 1670000 5) රු. 1250000
2) රු. 1720000 4) රු. 1475000

(.....)

28. එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවක් හා එක් සේවා දෙපාර්තමේන්තුවකින් (ගබඩාව) යුත් සමාගමකට පහත තොරතුරු අදාළ වේ.

	නිෂ්පාදන දෙපාර්තමේන්තුව	ගබඩාව
අයවැයගත පොදුකාර්ය පිරිවැය	(රු 500 000	40 000
ප්‍රාථමික පිරිවැය	රු. 640 000	
නිෂ්පාදන ඒකක සංඛ්‍යාව ඒකක	80 000	
අයවැයගත මුළු යන්ත්‍ර පැය	60 000	
ඒකකයක අයවැයගත යන්ත්‍ර පැය	6	

එකලස් දෙපාර්තමේන්තුව පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය සඳහා යන්ත්‍ර පැය භාවිතා කරයි. ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණද ?

1) රු. 118 3) රු. 54 5) රු.62
2) රු. 17 4) රු.73

(.....)

29. ව්‍යාපාරයක 2023/2024 සඳහා මුළු විකුණුම් රු. 800 000 කි. දායක විකුණුම් අනුපාතය 40% කි. ආරක්ෂිත ආන්තික අනුපාතය 20% කි. ලාභය කොපමණද?

1) රු. 64 000 3) රු. 80 000 5) රු. 160 000
2) රු. 320 000 4) රු. 640 000

(.....)

30. ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද

A. ආයෝජන ඇගයීම් ක්‍රම සඳහා සෑම විටම වට්ටම් කළ මුදල් ප්‍රවාහ භාවිතයට ගනී.
B. පිළිගෙවුම් කාල ක්‍රමයේදී මුළු ව්‍යාපෘති කාලය පුරා ලද මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගනී.
C. මූලික ආයෝජනයේ අගය ඉහළ අගයක් ගත් විට ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය අඩු වේ.
D. වට්ටමේ සාධකය ඉහළ අගයක් ගත් විට ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය ඉහළ අගයක් ගනී.

1) A,C හා D පමණි. 3) C හා D පමණි. 5) A හා B පමණි.
2) A පමණි. 4) C පමණි.

(.....)

31. ව්‍යාපාරයක මූල්‍ය ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ සත්‍ය ද (T) අසත්‍යද (F) යන්න සඳහන් කරන්න.

	ප්‍රකාශය සත්‍ය/අසත්‍ය
A. නෛතික අවශ්‍යතාවයන්ට අනුව ගිණුම් පිලියෙල කරනු ලබයි.	.....
B. මූලික වශයෙන් ව්‍යාපාරයක අරමුදල් සපයන්නනගේ තොරතුරු අවශ්‍යතාවක් පිළිබඳ අවධානය යොමුකරමින් පිළියෙල කරනු ලබයි.	.....
C. ව්‍යාපාරයක කළමනාකාරුවන්ගේ ඉල්ලීම මත තොරතුරු ජනනය කරයි.	.....
D. ව්‍යාපාරයක ඓතිහාසික පිරිවැය පදනම මත පමණක් මිනුම්කරන ලද තොරතුරු සපයනු ලබයි.	.....

32. පහත සඳහන් එක් එක් කරුණ සම්බන්දයෙන් මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර ඇති වෙනස කුමක් ද?

	කාරණය	මූල්‍ය ගිණුම්කරණය	කළමනාකරණ ගිණුම්කරණය
1)	තොරතුරු සපයන්නේ කාටද		
2)	තොරතුරු අයත් වන්නේ කුමන කාලයකටද යන වග		
3)	තොරතුරු සපයන වාර ගණන		
4)	තොරතුරුවල ස්වභාවය		

33. පහත ප්‍රකාශවල සත්‍ය, අසත්‍ය භාවය දක්වන්න. සත්‍ය/අසත්‍ය

1) පරිගණකගත ගිණුම්කරණ ක්‍රම බිහි වී ඇත්තේ තාක්ෂණික පරිසරයේ සිදු වූ වෙනස්වීම් නිසාය. .....

2) උද්ධමන ගිණුම්කරණය බිහි වී ඇත්තේ ස්වාභාවික පරිසරය වෙනස්වීම නිසාය. .....

3) ගිණුම්කරණ ප්‍රමිතීන් කලින් කලට වෙනස් වන්නේ තාක්ෂණික පරිසරය වෙනස්වීම නිසාය. .....

4) වත්කම් මැනීම සඳහා විවිධ මිනුම් ක්‍රම භාවිතා කරන්නේ තාක්ෂණික පරිසරයේ වෙනස්වීම් නිසාය .....

34. ව්‍යාපාරයක 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල මුළු වත්කම් රු 80 000 න් වැඩිවී ඇති අතර වගකීම් රු 20 000 න් අඩුවී ඇත වර්ෂය තුල සතියකට රු 1 000 බැගින් ගැණිලි කර ඇති අතර රු 30000ක අතිරේක ප්‍රාග්ධනයක් යොදා ඇත 2025 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා උපයා ඇති ලාභය කොපමණද? රු .....

35. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු සහ සිද්ධීන් කීපයකි. ඒ ඒ ගනුදෙනුව සහා භාවිතා කරන මූලාශ්‍ර ලේඛණය සහ උපයෝගී පොත සඳහන් කරන්න.

ගනුදෙනුව	භාවිතා කරන මූලික ලියවිල්ල	සටහන් කල යුතු මූලික සටහන් පොත
1. ගිණුම්කරණ වරදක් නිවැරදි කිරීම		
2. භාණ්ඩ පරිත්‍යාග		
3. වත්කම් ක්ෂය කිරීම්		
4. දුන් මුදල් වට්ටම්		

36. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගිහාන්ගේ ව්‍යාපාරයේ පහත වැරදි සිදුවී ඇත.

- ලද වට්ටම් රු. 890 ක් දුන් වට්ටම් ගිණුමේ හර පැත්තේ රු. 980 ක් ලෙස සටහන් කිරීම.
- විකුණුම් ජ'නලය රු. 11,000 කින් අධිගණනය වීම.
- මුදල් ගෙවීම් ජ'නලයේ ණයහිමි විශ්ලේෂණ තීරුව රු. 4,000 කින් ඌනගණනය වීම. මුදල් ගිණුමේ ගෙවීම් වාර්තා කිරීම සඳහා විශ්ලේෂණ තීරුවල එකතුව භාවිතා කර ඇත.
- 2025 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු රු. 15,000 ක වැටුප් 2025.03.31 දිනට වාර්තා වී නොතිබුණි. අයිතිකරු විසින් සිදු කරන ලද රු. 22,000 ක අතිරේක ප්‍රාග්ධන යෙදවීම ගිණුම් පොත්වලින් සම්පූර්ණයෙන්ම මඟහැරී ඇත.

A. මෙම වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය කොපමණ ද? .....

B. ඉහත වැරදි හේතුවෙන් වාර්තා කරන ලද ලාභයට වන ශුද්ධ බලපෑම කොපමණ ද? .....

37. මසකට රු 200 බැගින් ගෙවන සාමාජිකයින් 120 ක්ද රු 5 000 බැගින් ගෙවා සමාජිකත්වය ලබාගත් යාවජීව සාමාජිකයින් 20 ක්ද සංගමයක සිටී. යාවජීව සාමාජික මුදල් ලැබුනු වර්ෂයේ ආදායමට ගනී. වර්ෂය ආරම්භයේ හිඟ සාමාජික මුදල් රු 2 000 ක් වූ අතර කලින් ලද සාමාජික මුදල් රු 6 000 කි. වර්ෂය තුල යාවජීව සාමාජික මුදල් ලැබී නැත.

A. වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම කොපමණ ද? රු. .....

B. වර්ෂය තුල ලැබුනු සාමාජික මුදල් ප්‍රමාණය කොපමණ ද? රු .....

38. අනිල් සහ බැසිල් විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ පොත්වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

	අනිල්	බැසිල්
2024.04.01 දිනට ජංගම ගිණුම් ශේෂ (බැර)	40 000	60 000
2025.03.31 දිනට ජංගම ගිණුම් ශේෂ (බැර)	35 000	65 000
වර්ෂය සඳහා ප්‍රාග්ධන පොලී	30 000	20 000
ගැණිලි	50 000	40 000
ප්‍රාග්ධන ගිණුම් ශේෂ	450 000	?

I. මෙම ව්‍යාපාරයේ 2024/ 2025 වර්ෂයේ ශුද්ධ ලාභය හෝ අලාභය රු .....

II. ලාභාලාභ අනුපාතය වන්නේ . රනිල් බැසිල් පිළිවලින් .....

III. මෙම ව්‍යාපාරයේ බැසිල්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය කොපමණද? .....

39. පහත සඳහන් එක් එක් ප්‍රකාශය තුලින් නිරූපණය වන්නේ සමහර ගිණුම්කරන මඟ පෙන්වීම හා භාවිතයන් ය. එම ප්‍රකාශ වඩාත් පැහැදිලි කරන වඩාත් උචිත ගිණුම්කරන සංකල්පය උපකල්පනය හෝ මූලධර්මය සඳහන් කරන්න.

A. ගිණුම්කරන වාර්තා තුල මිල මට්ටමේ වෙනස හඳුනා නොගනී. .....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

B. තොග අගය කිරීමේදී පිරිවැයෙන් හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය යොදා ගැනේ. .....

C. සියලු වැදගත් වාර්තා කරන දිනට පසු සිද්ධීන් වාර්තා කෙරේ. .....

D. කාලච්ඡේද වියදම් හඳුනාගනු ලබන්නේ ඒවා කාලච්ඡේදයේ ආදායම් ඉපයීමට දායක වූ විටය. .....

40. සමාගමක් තනි භාණ්ඩයක් මිලදී ගෙන විකුණනු ලබයි. විකුණුම් මිල ඒකකයක් සඳහා රු. 75 කි. 2024.03.01 දින ආරම්භක තොගයේ ඒකකයක් රු. 30/- බැගින් වූ ඒකක 100 ක් විය. 2024.03.10 දින සමාගම ඒකකයක් රු. 40 බැගින් ඒකක 150 ක් මිලදී ගන්නා ලදී. 2025.03.31 දින සමාගම විසින් ඒකක 200 ක් විකුණන ලදී. තොග නිකුත් කිරීමේදී පෙර ඇතුළු පෙර පිට (FIFO) මිල ක්‍රමය භාවිතා කරන්නේ නම් පහත දෑ දක්වන්න.

අ. 2025 මාර්තු මාසය සඳහා විකුණුම් පිරිවැය රු. .....

ආ. 2025 මාර්තු. 31 දිනට තොගයේ වටිනාකම රු. .....

ඉ තොග නිකුත් කිරීමේදී බරතැබූ සාමාන්‍ය මිල ක්‍රමය භාවිතා කරන්නේ නම් 2025 මාර්තු. මාසය සඳහා දළ ලාභය කොපමණ ද?.....

41. පහත තොරතුරු සීමිත පීරිස් පොදු සමාගමේ 2025/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ. (රු.)

- තොගය වැඩිවීම 350 000
- ණයගැති වැඩිවීම 240 000
- ණයහිමි අඩුවීම 230 000
- බදු ගෙවීම් 140 000
- ආදායම් බදු වියදම 170 000
- ක්ෂය 50 000
- උපකරණ විකුණුම් අලාභ 30 000

- මුදල් පදනම මත ගණනය කල ශුද්ධ ලාභය 3 200 000ක් නම් 2025/03/31 න් අවසන් වර්ෂය සඳහා ලාභය කොපමණ ද?.....

42. පහත සිදුවීම් LKAS 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි ප්‍රමිතයට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක්ද නැතිනම් ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක්ද යන්න සඳහන් කරන්න.

1) දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීමෙන් පසු මිනුම්කරණය සඳහා යොදා ගන්නා ආකෘතිය වෙනස් කිරීම .....
2) ආයතනයක් තොග අගය කිරීම සඳහා පෙර පිවිසි පෙර නිකුතු (FIFO) ක්‍රමය භාවිත කෙරේ .....
3) වත්කමක් ක්ෂය කිරීමට භාවිතා කරන ක්‍රමය වෙනස් කිරීම .....
4) වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් අපේක්ෂිත අලාභ සඳහා ඉඩ හැරීම් ලෙස වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් 10% ක වෙන් කිරීමක් පවත්වාගෙන යාමට තීරණය කිරීම .....

43. සීමා සහිත සලගාදු සමාගම අකලංක ආයතනයට එම ආයනයේ අවශ්‍යතාවය පරිදි වෙනස් කරන ලද පරිගණක මෘදුකාංග ස්ථාපිත කරන ලද පරිගණක 25 ක් සැපයීම සඳහා 2025 මාර්තු 01 දින ගිවිසුමකට එළඹෙන ලදි. අදාල මිල කියුමෙහි විස්තරය පහත දැක්වේ.

පරිගණකවල මිල 25 x 120 000	3 000 000
මෘදුකාංගවල මිල	400 000
මෘදුකාංග ආයතනයට ගැලපෙන පරිදි වෙනස් කිරීම	100 000

ගිවිසුමට අනුව මෘදුකාංග සහිත පරිගණක 2025මාර්තු 20 දින සැපයිය යුතුය. සල්ගාද සමාගම විසින් 2025 මාර්තු 05 දින පරිගනක සපයන ලද අතර මාර්තු 25 දින ආයතනයට සුදුසු පරිදි වෙනස් කල මෘදුකාංග ස්ථාපිත කරන ලදි.

I. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS – 15) අනුව මෙම ගිවිසුමෙහි ඇතුලත් කාර්යසාධන බැඳීම් මොනවාද?

.....

.....

II. සීමිත අපොන්සු සමාගම ඉහත වටිනාකම් ආදායම ලෙස හඳුනාගත යුත්තේ කුමන දිනයේදී ද?.....

44. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 (SLFRS – 16) යන ප්‍රමිතියේ සඳහන් විධිවිධානවලට අනුව කල්බදු ගැනුම්කරු විසින් මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව්කල යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

A. .....
B. .....
C. .....
D. .....

45. ව්‍යාපාරයක බදු පසු ලාභය රු. 160 000 කි. බදු අනුපාතය 20% කි. වර්ෂයේ ලාභාලාභ ගිණුමට අයකළ ක්ෂයවීම් රු. 40 000 ක් වූ අතර පොලී රු. 12 000 කි. ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ රු. 20 000 කි. ගෙවූ ලාභාංභ රු. 60 000 කි. මුළු හිමිකම් රු. 500 000

	2024.03.31	2025.03.31
තොගය	30 000	35 000
ණයගැතියෝ සහ ලැබිය යුතු අගයන්	40 000	32 000
ණයහිමියෝ සහ ගෙවිය යුතු අගයන්	25 000	32 000

I. මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රමාණය කොපමණද? .....
II. ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය කොපමණද ?.....

46. පහත ප්‍රකාශය ?සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න

1) කාලඡේදය සඳහා ක්ෂය සෑම විටම ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතුය .....
2) දේපළ පිරියත සහ උපකරණ අයිතමයක් මූලික හඳුනාගැනීමේදී පිරිවැයට මැනිය යුතු ය. .....
3) වත්කමක් ප්‍රවර්ධන වර්ෂය තුළ ප්‍රත්‍යාගනනය කිරීම තුළින් ඇති වූ අතිරික්තය එම වත්කම්සම්බන්ධව පෙර ප්‍රත්‍යාගණන ඌණතාවයක් නොමැති විට හඳුනාගත යුත්තේ වෙනත් විස්තීර්ණ ආදායමෙහි ය. .....
4) අමුද්‍රව්‍ය ශ්‍රමය හෝ වෙනත් නිෂ්පාදන පිරිවැයට අදාළව අපතේ යන ලද අසාමාන්‍ය වටිනාකම තොගයේ පිරිවැයට ඇතුළත් කරනු නොලබයි .....

47. ව්‍යාපාරයක 2024 / 2025 වර්ෂයේ ලාභය රු. 200 000 කි. විකුණුම් රු. 100 000 කින් වැඩි කලහොත් ලාභය රු. 40 000 ක් වැඩි වේ යැයි අපේක්ෂා කෙරේ. රු. 200 000 ක ලාභයේ දී ආරක්ෂිත ආන්තික අනුපාතය 25% කි. සමච්ඡේද ලක්ෂය වන්නේ .....

48. පහත තොරතුරු සමාගමක් විසින් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාළ වේ.

	ඒකකයක පිරිවැය (රු.)
මුළු පිරිවැය	800
සෘජු පිරිවැය	150
නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය	200

සියලු සෘජු පිරිවැය විචල්‍ය පිරිවැය වේ. තව ද නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙන් 30%ක් හා නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැයෙන් 25%ක් විචල්‍ය පිරිවැය වේ

A. ඒකකයක නිෂ්පාදන පිරිවැය රු .....
B. ඒකකයක මුළු විචල්‍ය පිරිවැය රු .....

49. පහත සඳහන් වන්නේ බෑග් නිෂ්පාදන ආයතනයක පිරිවැය අයිතමයන්ය. ඒ සඳහා සෘජු /වක්‍ර හා විචල්‍ය/ස්ථාවර ලෙස වර්ගීකරණය කර දක්වන්න.

	සෘජු /වක්‍ර	විචල්‍ය/ස්ථාවර
A. බෑග් නිෂ්පාදනයට රෙදි	.....	.....
B. බෑග් මසන්නාගේ වැටුප	.....	.....
C. කම්හල් විදුලිය	.....	.....
D. මහන මැෂින් ක්ෂය	.....	.....

50. අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී පහත සාධක මත ශුද්ධ වර්තමාන අගය වැඩිවේද, අඩුවේද, වෙනස් නොවේද යන්න සඳහන් කරන්න

	වැඩිවේ /අඩුවේද /වෙනස් නොවේ
1) වට්ටම් සාධකය වැඩිවීම.	.....
2) අවශේෂ අගය වැඩි වීම	.....
3) මූලික ආයෝජන මුදල අඩු වීම	.....
4) වාර්ෂික ශුද්ධ මුදල් ගලා ඒම අඩු වීම	.....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	33	S	II	ගිණුම්කරණය / Accounting	II	කාලය : පැය තුනයි / Time : Three hours

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.
Additional Reading Time : 10 minutes

උපදෙස් :

- **පළමුවන** හා **දෙවන ප්‍රශ්න** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- අදාළ පෙර වැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

(1). භාණ්ඩ නිෂ්පාදනය හා බෙදාහැරීමේ කටයුතු වල නියුතු මැණික් පොදු සමාගමේ 2025.3.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ. මෙම සමාගම VAT සඳහා ලියාපදිංචි වී ඇති සමාගමක් වේ.

	හර (රු."000")	බැර (රු."000")
විකුණුම්		18980
අමුද්‍රව්‍ය ගැණුම්	5900	
2024.04.01 දිනට		
නිමි තොගය	200	
අමුද්‍රව්‍ය තොගය	300	
නොනිමි තොගය	250	
වැටුප්	1000	
උපචිත EPF		100
මුදල්	2575	
ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්	300	
විදුලි ගාස්තු	200	
කම්හල් කුලී	300	
ප්‍රචාරණ වියදම්	80	
වෙළඳ ලැබිය යුතු දෑ	410	
වෙළඳ ගෙවිය යුතු දෑ		350
වගකීම් සහතික ප්‍රතිපාදන(2024.04.01)		200
පුරස්කාරය	100	
දුන් වට්ටම්	30	
ලද වට්ටම්		20
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	950	
මෝටර් රථ විකුණුම්		1 500
කල්බදු ණය හිමි		1 500
ආදායම් බදු ප්‍රතිපාදන 2024.04.01		220
ගෙවූ ආදායම් බදු * 2023/2024	200	
* 2024/2025	650	
සා.කොා.ප්‍රා.		1 500
රඳවාගත් ඉපයුම්		1 200
ප්‍රත්‍යාගණන සංචිතය		200
පොදු සංචිතය		300
අධ්‍යක්ෂ ගාස්තු	150	
කල්බදු ගෙවීම්	1 500	
දේපළ පිරියත උපකරණ	10 625	
අනෙකුත් බෙදා හැරීමේ වියදම්	350	
එකතුව	**26 070**	**26 070**

අතිරේක තොරතුරු,

(i) ගැණුම් හා විකුණුම් තුළ 18% ක VAT ඇතුළත් වේ. තව ද 2025.03.01 දින විකුණුම් අත්තිකාරමක් ලෙස ලද රු.100 000 මුදලක් විකුණුම් ලෙස ගිණුම් තබා ඇත. (මෙම අත්තිකාරම සඳහා VAT අදාළ නොවේ.)

(ii) 2025.03.31 දින අවසන් තොග සංයුතිය පහත දැක්වේ.

	පිරිවැය (රු."000")	**ශුද්ධ උපලබ්ධි අගය (රු."000")**
නිමි	350	300
නොනිමි	300	275
අමුද්‍රව්‍ය	300	380

(iii) ප්‍රවර්තන වර්ෂය තුළ වගකීම් සහතික සඳහා රු.150 000 ක් ගෙවා ඇති අතර එය බෙදාහැරීමේ වියදම් තුළ වාර්තා කර ඇත. වර්ෂය තුළ (VAT රහිත) විකුණුම් වටිනාකම සඳහා 2% ක වගකීම් සහතික වෙන් කිරීමක් කළ යුතු වේ.

(iv) ව්‍යාපාරයේ 2024.04.01 දිනට දේපළ පිරියත වල ධාරණ අගය සහිත සංයුතිය පහත දැක්වේ.

දේ.පි.උ.	2024.4.01 ධාරණ අගය "රු.000"	ක්ෂය ප්‍රතිශතය	මිලදී ගත් දිනය
ඉඩම්	2000	-	2010.4.1
ගොඩනැගිලි	2200	10%	2019.10.1
මෝටර් රථ	3125	12.5%	2021.4.1
යන්ත්‍රෝපකරණ	3300	20%	2022.1.1

- ඉඩම දෙවන වරට 2024.04.01 රු. 1 700 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි. මේ පිළිබඳ කිසිවක් ගිණුම්ගත කර නොමැත.
- පිරිවැය රු. 2 000 000 ක මෝටර් රථයක් 2024.10.01 දින රු. 1 500 000 කට විකුණා ඇත. මෙය මුදල් ගිණුම හර කර මෝටර්රථ විකුණුම් ගිණුමට බැර කර ඇත. වෙනත් කිසිදු සටහනක් තබා නැත.
- ගොඩැනැගිල්ල පළමු වර 2025.3.31 දින රු. 2 000 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. මේ පිළිබඳ ගිණුම්වල සටහන් කළ යුතු වේ.
- 2025.01.01 දින රු. 500 000 ක පිරිවැයක් යොදවා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවක් සිදු කර ඇත. මෙම වියදම නිෂ්පාදන පොදු කාර්ය වියදම් වල දක්වා තිබේ. නමුත් මෙම අලුත්වැඩියාව නිසා යන්ත්‍රවල ඉතිරි ඵලදායී ජීවිත කාලය වසර 5 ක් දක්වා වැඩි වී ඇත.
- ගොඩනැගිලි පරිපාලන කටයුතු සඳහා ද, මෝටර් රථ බෙදා හැරීම් කටයුතු සඳහා ද යොදා ගනී. නිෂ්පාදන කටයුතු සඳහා කම්හලක් කුලියට ගෙන ඇති අතර උපචිත කම්හල් කුලිය 50 000 කි.

(v) පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය මෝටර් රථයක් 2024.04.01 කල් බදු පදනම මත ලබාගෙන ඇත. ගෙවූ රු. 1 000 000 ක මූලික ගෙවීම සහ රු. 500 000 ක පළමු වාරිකය කල් බදු ගෙවීම් ගිණුමට හර කර ඇත. කල් බදු කාලය වසර 4 ක් වන අතර ඵලදායී ජීවිත කාලය වසර 10 කි. කල් බදු කාලය අවසානයේ මෝටර් රථයේ අයිතිය සමාගමට මාරු වේ. වාර්ෂික කල්බදු වාරිකය රු. 500 000 ක් වන අතර කල් බදු වාරික වල ඇතුළත් ප්‍රාග්ධන ණය කොටස පහත දැක්වේ.

	"රු.000"
2024/2025	400
2025/2026	380
2026/2027	370
2027/2028	350

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(vi) පෙර වර්ෂයට අදාළ බද්ධ එකඟව ගෙවා ඇති අතර, ප්‍රවර්තන කාලච්ඡේදයට අදාළ ආදායම් බද්ධ රු.850 000 කි.

(vii) උපචිත අධ්‍යක්ෂ ගාස්තු 50 000 ක් වන අතර උපචිත විගණන වියදම 30 000 කි.

(viii) නිෂ්පාදන සෘජු වැටුප් 500 000 වන අතර එය මෙතෙක් ගෙවා හෝ ගිණුම්ගත කර නැත.

(ix) විදුලි ගාස්තුවෙන් 40% ක් පරිපාලන අංශයට වන අතර ඉතිරිය කම්හල සඳහා වේ.

(x) සේවකයාගේ දළ වැටුප මත සේවක EPF දායකය 10% වේ. සේවා දායකය 15% කි. ETF සේවා දායකය 3% කි. මෙතෙක් සේවා දායකය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත. (මෙය අදාළ වන්නේ ශේෂ පිරික්සුමේ ඇති දළ වැටුප් සඳහා පමණි)

(xi) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ

- පොදු සංචිතයට රු. 200 000 ක් මාරු කිරීම.
- සාමාන්‍ය කොටසට රු.2 බැගින් අවසාන ලාභාංශයක් යෝජනා කිරීම.

අවශ්‍ය වන්නේ,

(1) 2025.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදාම් ප්‍රකාශය

(2) 2025.3.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

(3) 2025.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය.

(ලකුණු 40)

(2).(අ). සපත්තු නිෂ්පාදනයේ යෙදෙන ව්‍යාපාරයක සැකසුම් හා නිමවුම් ලෙස නිෂ්පාදන අංශ 2 ක් සහ ගබඩාව ලෙස සේවා දෙපාර්තමේන්තුවත් පවත්වා ගනී. මෙම ව්‍යාපාරය විසින් ලබා දී ඇති ඇස්තමේන්තු ගත තොරතුරු පහත දැක්වේ.

සේවක වැටුප්	900 000
විදුලි වියදම්	80 000
යන්ත්‍ර ක්ෂය	250 000
ගබඩා කුලිය	160 000
ගොඩනැගිලි ක්ෂය	200 000
සේවක සුභසාධන වියදම්	135 000
යන්ත්‍ර රක්ෂණය	30 000

- අනෙකුත් තොරතුරු
  - ගබඩාව කුලියට ලබාගත් ගොඩනැගිල්ලක ද කර්මාන්තශාලාව ව්‍යාපාරයට අයත් ගොඩනැගිල්ලක ද පවත්වා ගෙන යනු ලබයි.

අයිතමය	සැකසුම්	නිමවුම්	ගබඩාව
භූමි ප්‍රමාණය m^2	120	80	40
භාවිතා කළ විදුලි ධාරිතාව kwh	250	200	50
යන්ත්‍ර පිරිවැය	රු. 1 500 000	රු. 1 000 000	-
සේවක සංඛ්‍යාව	50	30	10
යන්ත්‍ර පැය	1 340	1 430	
ශ්‍රම පැය	1 750	1 820	

- ගබඩා පොදු කාර්ය පිරිවැය සැකසුම් හා නිමවුම් අංශ අතර සමානව නැවත විභජනය කරයි.
- සපත්තු යුගලයක,

  සෘජු ද්‍රව්‍ය පිරිවැය රු.200

  සෘජු ශ්‍රම පිරිවැය රු.200

  ගත වන කාලය

  සැකසුම් අංශය යන්ත්‍ර පැය ½

  නිමවුම් අංශය ශ්‍රම පැය 1½

- සැකසුම් අංශය යන්ත්‍ර පැය මත ද නිමවුම් අංශය ශ්‍රම පැය මත ද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහනය කරනු ලබයි.
- සපත්තු යුගලයක් විකුණුම් මිල මත 30% ක ලාභ ප්‍රතිශතයක් සහිතව අලෙවි කරනු ලබයි.

අවශ්‍ය වන්නේ,

(1) පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
(2) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත
(3) සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය
(4) සපත්තු යුගලයක විකුණුම් මිල

(ලකුණු 20)

(ආ) සීමිත රනුක සමාගමේ සේවක වැටුප් සම්බන්ධව 2025 ජනවාරි සඳහා පහත තොරතුරු ඉදිරිපත් කරයි.

- දිනක සේවා කාලය පැය 08 කි. සතියකට වැඩ කළ යුතු දින ගණන 05 ක් වේ.
- සතියේ දිනයක පැයක වැටුප් අනුපාතය රු.400 කි.
- අතිකාල පැයක වැටුප සාමාන්‍ය පැයක වැටුප මෙන් 1½ ක් වේ.
- EPF සේවක දායකය දළ වැටුප මත 10% ක් වන අතර සේවා දායකය 15% කි.
- ETF සේවා දායකය දළ වැටුප මත 3% කි.
- සෑම සේවකයෙකුටම රු.10 000 ක ජීවන වියදම් දීමනාවක් හිමි වේ.
- සේවක සුභසාධන සඳහා සෑම සේවකයෙකුගෙන්ම රු.1000 අවකරණය කරනු ලැබේ.
- දිනෙත්ගේ බැංකු ණය වාරිකය රු.15 000 ක් වැටුපෙන් අඩු කළ යුතු වේ.
- සේවකයන් මාසය තුළ වැඩකළ පැය ගණන් පහත දැක්වේ.

සේවකයාගේ නම	**වැඩ කළ පැය ගණන**
දිනෙත්	170
ඉක්රාම්	175
පසිඳු	165

- සේවක වැටුප අදාළ මාසයේ දී ම ගෙවන අතර EPF හා ETF දායකය එළඹෙන මාසයේ 15 දින ප්‍රේෂණය කරනු ලබයි.

අවශ්‍ය වන්නේ,

(i) වැටුප් ලේඛනය
(ii) වැටුප් ගිණුම් තැබීමට අවශ්‍ය ලෙජර් ගිණුම්

(ලකුණු 10)

(ඇ). නිෂ්පාදන සමාගමක් නිපදවන X නැමති අයිතමය සඳහා අමුද්‍රව්‍ය 5 kg ක් අවශ්‍ය වේ.

- මාසික අමුද්‍රව්‍ය පරිභෝජනය 1000 kg වේ.
- EOQ අනුව වාර්ෂික ඇණවුම් වාර ගණන 06
- තොග පරිභෝජනය හා පොරොත්තු කාලය

	සතියක නිමවුම් ඒකක	**පොරොත්තු කාලය (සති)**
උපරිම	60	?
අවම	?	2
සාමාන්‍ය	50	3

අවශ්‍ය වන්නේ,

(1) EOQ (ආර්ථික ඇණවුම් ප්‍රමාණය)
(2) යලි ඇණවුම් මට්ටම
(3) උපරිම තොග මට්ටම
(4) අවම තොග මට්ටම
(5) සාමාන්‍ය තොග මට්ටම

(ලකුණු 10)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(3). 2025.3.31 දිනෙන් වර්ෂය සඳහා 'බිගුසර' ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයයි. මෙම ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී සිටින අතර VAT ප්‍රතිශතය 18% ක් වේ.

(i) මුදලින් 800 000 ක් සහ 1 500 000 ගොඩනැගිල්ල යොදවා ව්‍යාපාරය ආරම්භ කිරීම.
(ii) රු. 500 000 බැංකු ණයක් ගැනීම.
(iii) අත්පිට ගැණුම් VAT සහිතව 708 000 කි.
(iv) ණයට ගැණුම් VAT සහිතව 944 000 කි.
(v) පිරිවැය 500 000 ක් වූ තොගයක් රු.1 000 000 කට අත්පිට මුදලට විකිණීම (VAT සහිත අගය)
(vi) පිරිවැය 400 000 තොගයක් VAT සහිත අගය 826 000 ණයට විකිණීම.
(vii) මුදලින් මෙහෙයුම් වියදම් රු.150 000 ක් ගෙවූ අතර තවත් රු.20 000 ක් උපචිතව ඇත.
(viii) රු.30 000 ක කොමිස් ආදායමක් ලද අතර තවත් රු.10 000 ක් ලැබිය යුතුව ඇත.
(ix) 20 000 ක වට්ටම් දුන් පසු ණයගැතියන්ගෙන් රු.280 000 ක් ලැබුණි.
(x) 200 000 ක ණයහිමි ශේෂයක් පියවීමේ දී ලද වට්ටම 5% කි.
(xi) ගොඩනැගිලි පිරිවැය මත 10% ක් ක්ෂය කළ යුතු වේ.
(xii) අයිතිකරු තම පෞද්ගලික මුදලින් රු.50 000 ක බැංකු ණය වාරිකයක් ගෙවූ අතර එතුළ 15 000 ක පොලිය ද ඇතුළත් වේ.

අවශ්‍ය වන්නේ,

(1) පහත ගිණුම්කරණ සමීකරණයේ ගනුදෙනු ඇතුළත් කිරීම.

දේපළ පිරියත උපකරණ	මුදල්	ණයගැති	තොගය	ලැබිය යුතු ආදායම්	බැංකු ණය	ණය හිමි වෙ.ගෙ.යු.	උපචිත වියදම්	VAT	හිමිකම

(2) ආදායම් ප්‍රකාශය
(3) ශුද්ධ වත්කම් ඇසුරෙන් ලාභය හෝ අලාභය
(4) ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුම සහ බැංකු ප්‍රකාශයේ ශේෂය පහත කරුණු නිසා වෙනස් වී ඇත.

- ණයගැතියෙක් සෘජුවම බැංකුවේ තැන්පත් කළ රු.20000
- බැංකුව අය කළ ගාස්තුව රු.2000
- රක්ෂණ වාරිකය සඳහා නිකුත් කළ (මෙහෙයුම් වියදම් තුළ ඇතුළත්) රු.15 000 චෙක්පත බැංකුවට ඉදිරිපත් වී නැත.
- කොමිස් ආදායම් ලෙස ලද 30 000 ක චෙක්පත මෙතෙක් උපලබ්ධි වී නැත.

2025.3.31 දිනට සංශෝධිත මුදල් ශේෂය හා එදිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කරන්න.

(මුළු ලකුණු 40)

(4). (අ). 'රත්න' සමාගමේ 2024.04.01 දිනට ගිණුම් වල පැවති ශේෂයන් පහත දැක්වේ. මෙම සමාගම VAT සඳහා ලියාපදිංචි සමාගමක් වන අතර VAT ප්‍රතිශතය 18% වේ.

	(රු."000")
මුදල්	250
වෙළඳ ලැබිය යුතු දෑ	200
වෙළඳ ගෙවිය යුතු දෑ	350
VAT පාලන (බැර)	36

- ණයට ගැණුම් පිළිබඳ තොරතුරු.

දිනය	සැපයුම්කරු	VAT රහිත වටිනාකම	ණය මුදල පිය වූ දිනය හා කොටස
2024/4/20	දසුන්	400 000	2024/5/3 (50%)
2024/6/18	කවිෂ්ක	600 000	2024/6/30 (25%)
2024/10/1	භානුල	300 000	2024/10/12 (100%)

ණය මුදල් දින 15 ක් ඇතුළත පියවන්නේ නම් 5% ක මුදල් වට්ටම් හිමි වේ. ණය මුදල් පිය වූ දිනය සහ පියවූ කොටස අවසාන තීරුවේ දැක් වේ. වට්ටම් ලැබෙනුයේ VAT රහිත අගයට වේ.

- ණයට විකුණුම් පිළිබඳ තොරතුරු.

දිනය	ගණුදෙනුකරු	VAT රහිත වටිනාකම	ණය මුදල පිය වූ දිනය හා කොටස
2024/4/5	ත්‍රිමා	800 000	2024/4/13 30%
2024/6/10	ප්‍රභා	700 000	2024/6/30 40%
2024/9/6	සරා	360 000	2024/9/18 50%)

දින 20 ක් තුළ ණය මුදල් ලැබීමේ දී VAT රහිත විකුණුම් අගය මත හිමිවන, ලද වටම 5% ක් වන අතර දින 10 ක් තුළ මුදල් ලැබෙන්නේ නම් 10% වට්ටම් ලබා දේ.

- අනෙකුත් මුදල් ගෙවීම් හා ලැබීම්.
  - අත්පිට විකුණුම් VAT සහිත අගය රු. 531 000
  - අත්පිට ගැණුම් VAT සහිත අගය රු. 413 000
  - මෙහෙයුම් වියදම් ගෙවීම් 150 000
  - ලද කුලී ආදායම රු. 100 000
  - VAT ගෙවීම රු. 60 000
  - මුදල් ගැනිලි රු. 15 000
  - අමතර ප්‍රාග්ධනය යෙදවීම රු. 50 000
  - ආරම්භක ණය ගැති ශේෂය සම්පූර්ණයෙන්ම පිය වූ අතර 10% ක වට්ටමක් දෙන ලදි.
  - ආරම්භක ණය හිමියන්ගේ ශේෂය සම්පූර්ණයෙන් පියවීමට රු. 315 000 ගෙවිය.
- ආපසු යැවුම් සහ ආපසු එවුම් පිළිබඳ තොරතුරු.

දිනය	සැපයුම්කරු	VAT සහිත වටිනාකම රු. “000”
5/10	දසුන්	35.4
7/5	කවිශ්ක	59

දිනය	ගණුදෙනුකරු	VAT සහිත වටිනාකම රු. “000”
5/1	තිමා	94.4
7/1	ප්‍රභා	82.6
9/30	සරා	70.8

අවශ්‍ය වන්නේ,

(1) (i). ලැබීම් ජ’නලය
(ii). ගෙවීම් ජ’නලය
(iii). ගැණුම් ජ’නලය
(iv). විකුණුම් ජ’නලය
(v). ආපසු එවුම් ජ’නලය
(vi). ආපසු යැවුම් ජ’නලය

(2) පොදු ලෙජරයේ පහත ගිණුම්
(i). මුදල් පාලන ගිණුම
(ii). ණයගැති පාලන ගිණුම
(iii). ණයහිමි පාලන ගිණුම
(iv). VAT පාලන ගිණුම

(ලකුණු 30)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ආ). STAR ක්‍රීඩා සමාජයේ පහත තොරතුරු 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

අයිතමය	2024.01.01	2024.12.31
කලින් ලද සාමාජික මුදල්	6 000	9 600
හිඟ සාමාජික මුදල්	3 600	7 200
සමුච්චිත අරමුදල	?	?
යාවජීව සාමාජික මුදල්	216 000	?
මුදල්	340 000	?
දේ.පි.උ.	500 000	630 000

- ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 120 ක් සිටින අතර ඉන් 20 ක් යාවජීව වේ.
- එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු.1200 ක් වේ. යාවජීව සාමාජිකත්වය මීට වසරකට පෙර 2023.01.01 හඳුන්වා දෙන ලදි. එහිදී යාවජීව සාමාජිකත්වය ලබා ගැනීමට වසර 10 ක සාමාජික මුදල් එකවර ගෙවිය යුතු විය. තව ද වසර 10 ක් තුළ සමානව සාමාජික මුදල් ආදායමේ හඳුනා ගනී.
- 2024.01.01 සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයන් දෙදෙනෙක් ප්‍රවර්තන වර්ෂය තුළ ද සාමාජික මුදල් නොගෙවූ බැවින් සාමාජිකත්වය ඉවත් කොට හිඟ මුදල් කපා හැරීමට තීරණය කරන ලදි.
- වර්ෂය තුළ රු.200 000 ක්‍රීඩා උපකරණ මිල දී ගෙන ඇත.

අවශ්‍ය වන්නේ,

(1) සාමාජික මුදල් ගිණුම
(2) යාවජීව සාමාජික මුදල් ගිණුම
(3) දේපළ පිරියත උපකරණ වාර්ෂික ක්ෂය

(ලකුණු 10)

(5).(අ). පබා, අමා සහ මනු හවුල් ව්‍යාපාරයේ ගිවිසුම පහත දැක්වේ.

- ලාභඅලාභ 2:2:1 අනුපාතයට බෙදා ගනී.
- පබාට රු.20 000 ක සහ අමාට රු. 25 000 ක මාසික වේතන හිමි වේ.
- ප්‍රාග්ධනයට අමතරව සැපයූ ණය සඳහා 6% ක පොලී හිමි වේ.
- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොලී හිමි වේ.

(1). 2025.3.31 දිනට මෙම ව්‍යාපාරයේ ගණනය කර ඇති කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 1 200 000 ක් වේ. නමුත් එම ලාභය ගණනය කිරීමේ දී පහත වැරදි සැලකිල්ලට ගෙන නැත.

- පබාට මාස 8 ක වැටුප් ගෙවා ඇති අතර එය වැටුප් වියදමක් ලෙස වාර්තා කර ඇත.
- රු.23 000 ක ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය අමා විසින් තම පෞද්ගලික වියදමෙන් ගෙවා ඇති අතර ඒ පිළිබඳ සටහනක් තබා නැත.
- රු. 80 000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත් වලින් මඟ හැරී ඇත.
- පබා සහ මනු පිළිවෙළින් රු.15 000 හා 20 000 ක භාණ්ඩ ගැනිලි කර ඇති අතර ඒ පිළිබඳ ගිණුම් සටහන් කර නැත.
- අමාගේ ණය පොලී ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නැත.
- රු. 50 000 ක කොමිස් ආදායම්, කොමිස් වියදම් ලෙස සටහන් කර තිබුණි.

(2). 2024.4.1 පැවති හිමිකම් හා ණය ශේෂ පහත වේ.

	ප්‍රාග්ධන ගිණුම	ජංගම ගිණුම	ණයහිමි ගිණුම
පබා	3 000 000	200 000	-
අමා	2 000 000	250 000	200 000
මනු	1 000 000	150 000	-

(3). 2025.03.31 මනු ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර තිබේ.

- ඇයගේ කීර්ති නාම කොටස රු. 200 000 කි.
- කීර්ති නාමය ප්‍රාග්ධන ගිණුම මඟින් ගැලපිය යුතුය.
- ඇයගේ හිමිකම ණය ගිණුමකට මාරු කිරීටම එකඟ විය.
- ඇය විශ්‍රාම ගත් පසු පබා හා අමා සමානව ලාභ බෙදා ගැනීමට එකඟ විය.

අවශ්‍ය වන්නේ,

(1) 2025.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ සංශෝධන ලේඛනය හා ලාභ විසර්ජන ප්‍රකාශනය.

(2) ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම

(ලකුණු 20)

(ආ).සුභසාධන සංගමයකට ආධාර පිණිස "උත්තරාංගී" නමින් සංගීත ප්‍රසංගයක් සූදානම් කර තිබේ. මෙහි ප්‍රවේශ පත්‍රයක් රු. 3000 කට අලෙවි කරයි.

මේ සඳහා සම්බන්ධ පහත තොරතුරු සපයා ඇත.

- ගායකයන් සඳහා ගෙවීම. 500 000
- සංගීත කණ්ඩායමට 150 000
- ප්‍රචාරණය වියදම් 40 000
- ටිකට්පත් මුද්‍රණ වියදම් 5 000
- ශබ්ද විකාශන සඳහා 100 000
- ආලෝකකරණ කටයුතු සඳහා 25 000
- ශාලා කුලී 150 000
- සෑම ප්‍රේක්ෂකයෙකුට ම ආහාර පාර්සලයක් ලබාදීම. 500
- ප්‍රචාරණ වියදම්, ටිකට්පත් මුද්‍රණය සහ ආලෝකකරණ කටයුතු සඳහා සම්පූර්ණ අනුග්‍රහකයෙක් සම්බන්ධ වේ.

අවශ්‍ය වන්නේ,

(1) සංගීත ප්‍රසංගයේ ස්ථාවර පිරිවැය.

(2) සංගීත ප්‍රසංගයට අදාළ දායකය.

(3) මුළු ස්ථාවර පිරිවැය ආවරණය කර ගැනීමට සහභාගි විය යුතු ප්‍රේක්ෂකයින් ගණන.

(4) රු.500 000 ලාභයක් ලැබීමට සහභාගි විය යුතු සංඛ්‍යාව

(5) රු. 200 000 ලාභයක් ලැබීමට සහ ප්‍රේක්ෂකයින් 500 ක් සහභාගි වන්නේ නම් ප්‍රවේශ පත්‍රයක් විකිණිය හැකි අවම මිල කොපමණ ද?

(6) ගායකයින් සඳහා ගෙවිය යුතු වටිනාකම තවත් 50% කින් නොවැළැක්විය හැකි හේතුවක් මත වැඩි වූයේ නම් සංගමයට රු.350 000 ලාභයක් ගැනීමට සහ ප්‍රේක්ෂකයින් 600 ක් සහභාගි වන්නේ නම් ප්‍රවේශ පත්‍රය විකිණිය හැකි අවම මිල කොපමණ ද?

(6).(අ). පහත දැක්වෙන්නේ කසුන් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන තොරතුරු වේ.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශය	**රු. "000"**
විකුණුම්	30 000
විකුණුම් පිරිවැය	14 000
වෙනත් ආදායම්	500
බෙදාහැරීමේ වියදම්	(2 700)
පරිපාලන වියදම්	(3 200)
මූල්‍ය වියදම්	(600)
බදු පෙර ලාභය	10 000
ආදායම් බදු	(2 000)
කාලච්ඡේදයේ ලාභය	8 000

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

අයිතමය	2025.3.31	2024.4.1
වත්කම්	රු. "000"	රු. "000"
දේපළ පිරියත උපකරණ	22 000	20 000
දේපළ පිරියත උපකරණ ක්ෂය වෙන් කිරීම	(6 250)	(6 000)
තොගය	1 300	1 500
ණයගැති	2 000	1 200
මුදල්	8 050	500
	27 100	**17 200**
හිමිකම් හා වගකීම්		
සා.කොා.ප්‍රාග්ධනය	10 000	6 000
රඳවාගත් ඉපැයුම්	7 800	3 000
පොදු සංචිතය	2 000	1 800
ප්‍රත්‍යාගණන සංචිතය	2 200	1 200
බැංකු ණය	3 500	4 000
ණය හිමි	500	300
උපචිත පොලී	500	400
උපචිත බදු	600	500
	27 100	17 200

අතිරේක තොරතුරු,

(1) වර්ෂය තුළ ව්‍යාපාරය සතු ඉඩම ලාභයක් සහිතව ප්‍රත්‍යාගණනය කර ඇත. එසේම 5 000 000 ක් පිරිවැය වූ 2022.10.01 දින මිලදී ගත් මෝටර් රථයක් 2025.3.31 දින රු. 4 500 000 කට විකුණා ඇත. සියලු දේපළ පිරිවැය මත 10% ක්ෂය කරයි. තව ද වර්ෂය තුළ දේපළ පිරියත මිල දී ගැනීම් සිදු කර ඇත.

(2) කොටසක් රු. 30 බැගින් කොටස් 100 000 රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරමින් ප්‍රසාද නිකුතුවක් සිදු කර ඇත. හිමිකම් නිකුතුවක් ද සිදු කර ඇත.

(3) බැංකුණය සඳහා වාර්ෂික පොලී අනුපාතය වාර්ෂිකව 15% ක් වේ.

අවශ්‍ය වන්නේ,

(1) LKAS 7 ප්‍රමිතිය අනුව වක්‍ර ක්‍රමය භාවිතය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

(ලකුණු 20)

(ආ).ඉහත තොරතුරු ඇසුරෙන් පහත දැක්වෙන ගිණුම්කරණ අනුපාත දක්වන්න.

- දළ ලාභ අනුපාතය
- පොලී ආවරණ අනුපාතය
- තොග පිරිවැටුම් අනුපාතය
- තොග රැඳවුම් කාලය (වසරකට දින 360 ලෙස ගන්න)
- ණයගැති පිරිවැටුම් අනුපාතය (සියලු විකුණුම් ණයට වේ.)

(ලකුණු 10)

(අ). සීමිත රත්න සමාගමේ යන්ත්‍රයක් මිල දී ගැනීම සම්බන්ධ පහත තොරතුරු ඉදිරිපත් කරයි. මෙය VAT (18%) සඳහා ලියාපදිංචි සමාගමකි.

	රු. 000
නව යන්ත්‍රයේ ගැණුම් මිල (VAT සහිත)	14 160
සවි කිරීමේ වියදම්	500
සවි කිරීමේ වෘත්තීය ඉංජිනේරු ගාස්තු	200
ව්‍යාපාරික ස්ථානයට ගෙන ඒමේ වියදම	100
සුන්බුන් අගය	800
කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය	500
පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල	2 000
වෙළඳපොළ සමීක්ෂණ වියදම	300
අත්හදා බැලීම් පිරිවැය	500
ඵලදායි ජීවිත කාලය	5

අතිරේක තොරතුරු,

(1) කාරක ප්‍රාග්ධනය අවසන් වර්ෂයේ නැවත අය කර ගත හැකිය.

(2) එක් එක් වර්ෂවල විකුණුම් ආදායම්, ක්ෂය සහිත මෙහෙයුම් වියදම් සහ 10% වට්ටම් සාධකය පහත දැක්වේ.

වර්ෂය	1	2	3	4	5
විකුණුම් ආදායම	4 360	5 300	5 800	5 400	5 800
මෙහෙයුම් වියදම්	3 600	4 200	4 400	4 100	4 500
10%	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍ය වන්නේ,

1. ව්‍යාපෘතියේ මූලික ආයෝජනය අයිතම වෙන වෙනම දක්වමින්
2. එක් එක් වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය
3. ශුද්ධ වර්තමාන අගය පදනම්ව තීරණය
4. පිළිගෙවුම් කාලය.

(ලකුණු 10)

*****

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ගිණුම්කරණය 1 පිළිතුරු පත්‍රය - උගව පළාත 2025

1) **4**	2) **4**	3) **5**	4) **3**	5) **2**	6) **2**
7) **2**	8) **2**	9) **5**	10) **4**	11) **1**	12) **3**
13) **3**	14) **4**	15) **3**	16) **5**	17) **1**	18) **1**
19) **3**	20) **3**	21) **2**	22) **2**	23) **3**	24) **4**
25) **4**	26) **2**	27) **3**	28) **5**	29) **1**	30) **4**

31

A. සත්‍ය T B. සත්‍ය T C. අසත්‍ය F D. අසත්‍ය F

32

	මූල්‍ය ගිණුම්කරණය	කළමණාකරණ ගිණුම්කරණය
1	මූලික වශයෙන් භාහිර පාර්ශවයන්ට	අභ්‍යන්තර පාර්ශවයන්ට/කළමණාකරුවන්ට
2	අතීත තොරතුරු සපයයි	අතීත හා පුරෝකථන තොරතුරු
3	කාලච්ඡේදයකට වරක්	කළමණාකරණයේ අවශ්‍යතාවය පරිදි
4	මූල්‍ය තොරතුරු	මූල්‍ය හා මූල්‍ය නොවන

33

A. සත්‍ය T B. අසත්‍ය F C. අසත්‍ය F D. අසත්‍ය F

34 122 000

35

	භාවිතාකරන ලියවිල්ල	මූලික පොත
1	ජර්නල් වවුචරය	පොදු ජර්නලය
2	ජර්නල් වවුචරය	පොදු ජර්නලය
3	ජර්නල් වවුචරය	පොදු ජර්නලය
4	ලදුපත	මුදල් ලැබීම් ජර්නලය

36

A. **1870** බැර B. **1844** අඩුවේ

37

A. **288 000** B. **284 000**

38

I. **90 000** II. **3**:5 III. 300 000

39

A. ඓතිහාසික පිරිවැය සංකල්පය

B. ආරක්ෂණ සංකල්පය/විවක්ෂණ සංකල්පය

C. අනාවරන සංකල්පය

D. ගැළපුම් සංකල්පය

40

A. රු **7000** B. රු **2000** C. රු **7800**

41 රු **4080**

42

1. ප්‍රතිපත්ති වෙනස්වීමක්
2. ප්‍රතිපත්ති වෙනස්වීමක්
3. ඇස්තෙමින්තු වෙනස්වීම
4. ඇස්තෙමින්තු වෙනස්වීම

43

I.
1. පරිගණක 25ක් සැපයීම
2. ආයතනයට සුදුසු ලෙස වෙනස්කරන ලද මෘදුකාංග ස්ථාපිත කිරීම

II. මාර්තු 25

44

- භාවිත අයිතිය සහිත වත්කෙම් ක්ෂය වීම
- කල්බදු වගකීම මත පොළිය¡
- කල්බද්ධ සඳහා වන මුළු මුදල් ගලායාම්
- වර්ෂය තුල භාවිත අයිතිය සහිත වත්කම්වලට ඒකත්කිරීම්
- භාවිත අයිතිය සහිත වත්කෙම් ධාරන අගය

45

I. රු 282 000

II. 32%

46

1. අසත්‍ය
2. සත්‍ය
3. සත්‍ය
4. සත්‍ය

47 රු 1500 000

48

A. රු 600

B. රු 335

49

	සෘජු/වක්‍ර	ස්ථාවර/විචල්‍ය
A.	සෘජු	විචල්‍ය
B.	සෘජු	විචල්‍ය
C.	වක්‍ර	ස්ථාවර
D.	වක්‍ර	ස්ථාවර

50


1. අඩුවේ
2. වැඩිවේ
3. වැඩිවේ
4. අඩුවේ

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK